## මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව

## අනුරාධපුර දිස්ත්‍රික්කය

---

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 01 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 11 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ජුලි 30 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

### 1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ජේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) සමාලෝචිත වර්ෂයේ ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම රු.21,570,000 කින් වැඩිවන අයුරින් හා මෝටර් රථ හා කරත්ත වටිනාකම රු.525,000 කින් අඩුවන අයුරින් ප්‍රත්‍යාගණනයක් සිදුකර තිබුණු නමුත් ඒ සඳහා පිළිගත් වෘත්තීය සුදුසුකම්ලත් අයෙකුගේ සේවය ලබානොගෙන සභාවේ තාක්ෂණ නිලධාරී විසින් සිදුකර තිබුණි.

(ආ) රු.400,000 කට මිළදී ගෙන තිබුණු රෝද දෙකේ අත්ට්‍රැක්ටරයේ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල රු.225,000 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) ජාතික රක්ෂණ භාර අරමුදල තක්සේරු කරන ලද වත්කම්වල වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවලට ගැනීමේදී එකතුව රු.1,240,000 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ගෙවිය යුතු විගණන ගාස්තු ගණනය කර ගිණුම්වලට ගෙන නොතිබුණු අතර එකතුව රු.122,086 ක්වූ ඉකුත් වර්ෂ සඳහා ගෙවිය යුතු විගණන ගාස්තු සඳහා ගිණුම්වල ප්‍රතිපාදන ඇතිකර නොතිබුණි.

**1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම**

-----------------------------------

එකතුව රු.107,878,674 ක්වූ ගිණුම් විෂයයන් 04 ක් සම්බන්ධයෙන් අයිතිය සනාථ කිරීමේ ලියවිලි/ස්ථාවර වත්කම් ලේඛන/පැවැත්ම තහවුරු කිරීමේ ලියවිලි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

**02. මූල්‍ය සමාලෝචනය**

-----------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ මෙහෙයුම් අතිරික්තය රු.2,719,342 ක්වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ මෙහෙයුම් අතිරික්තය රු.3,602,120 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

-----------------------

**2.2.1 වරිපනම් බදු**

-----------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (i) වගන්තියට අනුව දියුණු කළ ප්‍රදේශ වශයෙන් ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශය ඇතුළත පිහිටියාවූ දේපලවල වාර්ෂික වටිනාකම මත වරිපනම් බදු පනවා අයකර ගැනීමට අවධානය යොමුකර නොතිබුණි.

**2.2.2 කඩකුලී**

---------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159 (i ) වගන්තියට අනුව සමාලෝචිත වර්ෂය තුලදී සභාවට අයවිය යුතු රු.219,949 ක හිඟ කඩකුලී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

--------------------------------------

**(අ)** සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වර්ෂ 05 කට වඩා පැරණි අයවිය යුතු සේවක ණය රු.174,182 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(ආ)** 203 වන අධිකාරය මෝටර් වාහන පනත, 2(i) වගන්තිය ප්‍රකාරව වාහන ලියාපදිංචි කළයුතු වුවත් වාහන 06 ක් ලියාපදිංචි නොකර ධාවනය කරමින් පැවතුණි.

**3.2 නිශ්ක්‍රීය වත්කම්**

**-------------------**

සභාව සතු වාහන 03 ක් වසර 02 කට වැඩි කාලයක සිට නිශ්ක්‍රීයව පැවතුණි.

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය**

**----------------------------**

මුදල් කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද 2011 ජූලි 26 දිනැති අංක FC/3/3/13 දරන චක්‍රලේඛයේ හා 2011 සැප්තැම්බර් 27 දිනැති අංක 452 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ විධිවිධානයන්ට පටහැනිව අවස්ථා 05 කදී ලියාපදිංචි සමිති සඳහා ඍජු කොන්ත්‍රාත් පිරිනමා තිබුණි.

**4. පද්ධති පාලනය**

**--------------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

**(අ)** ගිණුම්කරණය

**(ආ)** ආදායම් පරිපාලනය

**(ඇ)** වත්කම් කළමනාකරණය

**(ඈ)** ණයගැති හා ණයහිමි පාලනය